ශ්‍රී ලංකා මහ බැංකුව

| 2026 සැප්තැම්බර් 15 | මාර්ගෝපදේශ | 2026 අංක 01 |
| --- | --- | --- |

# ණයපත් (ක්‍රෙඩිට් කාඩ්) මෙහෙයුම් සඳහා අදාළ වන මාර්ගෝපදේශ

## 1. නෛතික සහ නියාමන අධිකාරිය

මෙම මාර්ගෝපදේශ 2023 අංක 1 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසියේ 2.2 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති අතර, ක්‍රෙඩිට් කාඩ්පත් නිකුත් කරන සියලුම බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් (මින්මතු "මූල්‍ය සේවා සපයන්නා" ලෙස හැඳින්වෙන) සඳහා අදාළ වේ.

ක්‍රෙඩිට් කාඩ්පතක් නිකුත් කිරීම මගින් කාඩ්පත් හිමියකු (මින්මතු "ගනුදෙනුකරුවා") සමඟ ගිවිසුම්ගත වන ඕනෑම මූල්‍ය සේවා සපයන්නකු (මින්මතු "නිකුත් කරන්නා" ලෙස හැඳින්වෙන) පහත මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රෙඩිට් කාඩ්පත් මෙහෙයුම් සිදු කරනු ලබන බවට තහවුරු කළ යුතු ය.

## 2. අරමුණ

ගාස්තු, අයකිරීම්, පොලී අනුපාතික, බිල්පත් හා ආපසු ගෙවීමේ නියමයන් පැහැදිලිව තහවුරු කිරීම තුළින් සාධාරණ, විනිවිදභාවයෙන් යුතු, වගකීම් සහගත සහ ගනුදෙනුකරුවා කේන්ද්‍ර කරගත් ක්‍රෙඩිට් කාඩ්පත් මෙහෙයුම් ක්‍රියාවලියක් ප්‍රවර්ධනය කිරීම; පාරිභෝගිකයන්ගේ ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳ වගකීම් සහගත ලෙස තක්සේරු කිරීම; අසාධාරණ හෝ නොමග යවන සුළු භාවිතයන්ට එරෙහි ආරක්ෂාව; පාරිභෝගික දත්ත සහ ගනුදෙනු ආරක්ෂිත ලෙස හැසිරවීම; පැමිණිලි, ආරවුල්, වංචා හිමිකම් සහ අනවසර ගනුදෙනු ඵලදායී ලෙස නිරාකරණය කිරීම; සහ සාධාරණ හා සමානුපාතික අයකර ගැනීමේ ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීම මෙම මාර්ගෝපදේශයේ අරමුණයි.

## 3. විෂයපථය

මෙම මාර්ගෝපදේශය සිල්ලර ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා පමණක් අදාළ විය යුතුය. ආයතනික සහ අනෙකුත් පොලී රහිත ක්‍රෙඩිට් කාඩ්පත් මෙම විෂය පථය යටතේ ආවරණය නොවිය යුතු ය.

## 4. අර්ථකථන

**බිල්පත් කාල සීමාව:** සියලුම ගිණුම් ක්‍රියාකාරකම් වාර්තා කරනු ලබන ක්‍රෙඩිට් කාඩ්පත් ප්‍රකාශන දෙකක් අතර කාල සීමාව, සාමාන්‍යයෙන් දින 28-31ක් වන අතර, එහිදී සියලු ගිණුම් ක්‍රියාකාරකම් වාර්තා කරනු ලැබේ.

**ගනුදෙනු දිනය:** ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමේ, මිලදී ගැනීමක්, ගෙවීමක් හෝ වෙනත් ක්‍රියාකාරකමක් සිදු කරනු ලබන දිනය

**ගිණුමට සටහන් කළ දිනය:** නිකුත් කරන්නා විසින් ගනුදෙනුවක් නිල වශයෙන් සටහන් කර ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට ඇතුළත් කරන ලද දිනය.

**ගිණුම් ප්‍රකාශන දිනය:** බිල්පත් චක්‍රයේ සියලුම ගිණුම් ක්‍රියාකාරකම් සාරාංශ කරමින් ක්‍රෙඩිට් කාඩ්පත් නිකුත් කරන්නා විසින් මාසික ප්‍රකාශනය නිකුත් කරන දිනය.

**හිඟ ශේෂය /සමස්ත ශේෂය:** මිලදී ගැනීම්, මුදල් අත්තිකාරම්, ගාස්තු, අයකිරීම්, උපචිත පොලිය සහ වෙනත් අදාළ මුදල් ඇතුළුව ඕනෑම අවස්ථාවක ගනුදෙනුකරුවා විසින් ගෙවිය යුතු මුළු මුදල.

**අවම ගෙවීම් අවශ්‍යතාව:** පොලී එකතු වීමකින් තොරව හා ප්‍රමාද ගෙවීම් ගාස්තු වළක්වා ගනිමින් ගිණුම යහපත් තත්ත්වයෙන් පවත්වා ගැනීම සඳහා ගනුදෙනුකරුවා විසින් නියමිත දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු මාසික ගිණුම් ප්‍රකාශන සටහනේ දක්වා ඇති අවම මුදල.

**ගෙවීම් නියමිත දිනය:** ප්‍රමාද ගෙවීම් ගාස්තු වැනි දඩුවම් වළක්වා ගැනීම සඳහා ගනුදෙනුකරුවා විසින් අවම වශයෙන් අදාළ අවම මුදල ගෙවා අවසන් කළ යුතු දිනය.

**ගෙවීම් දිනය:** ගනුදෙනුකරුවා විසින් හිඟ ශේෂයෙන් ඕනෑම මුදලක් ගෙවනු ලබන දිනය.

**සහන කාලය:** ප්‍රකාශන දිනය සහ ගෙවීම සිදු කිරීමට නියමිත දිනය අතර කාලය යි. මෙහිදී ගෙවිය යුතු ඉතිරි මුදල සම්පූර්ණයෙන් ගෙවා ඇත්නම් පොලියක් අය නොකෙරේ.

**දින ගණන:** සමස්ත ශේෂය සඳහා පොලිය ගණනය කිරීමේ දී භාවිත කෙරෙන කැලැන්ඩර් දින ගණන.

**ණය සීමාව:** කාඩ්පත් නිකුත් කරන්නකු විසින් ගනුදෙනුකරුවකුට කාඩ්පත මගින් ණයට ගැනීමට හෝ වියදම් කිරීමට අවසර ලබා දී ඇති උපරිම ණය ප්‍රමාණය.

## 5. විශේෂ නියාමන අවශ්‍යතා

### 5.1. ක්‍රෙඩිට් කාඩ්පත් නිකුතුව සහ කළමනාකරණය

5.1.1. කාඩ්පතට අදාළ අගය එකතු කළ විශේෂාංග, ත්‍යාග, සම්බන්ධ විධිවිධාන, හෝ අනෙකුත් කාඩ්පත් වෙනස්කම් කුමක් වුව ද සෑම නිකුත් කරන්නෙකුම, අදාළ ක්‍රෙඩිට් කාඩ්පත් සේවා සපයන්නා විසින් නම් කරන ලද ප්‍රධාන කාඩ්පත් වර්ගය යටතේ සෑම ක්‍රෙඩිට් කාඩ්පතක් ම වර්ගීකරණය කර හෙළිදරව් කිරීම කළ යුතු ය.

5.1.2. වෙනස්කොට සැලකීම වැළැක්වීම සහ සාධාරණ ප්‍රවේශය තහවුරු කිරීම සඳහා සෑම ක්‍රෙඩිට් කාඩ්පත් නිකුත් කරන්නෙකු විසින්ම අවම වශයෙන් එක් පහසුකමක් හෝ සහිතව ක්‍රෙඩිට් කාඩ්පත් නිකුත් කිරීම සිදුකළ යුතුය.

5.1.3. වසරකට (1) වැඩි කාලයක් සඳහා අක්‍රියව පවතින සියලුම ක්‍රෙඩිට් කාඩ්පත් (ගනුදෙනු සිදු කිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් සක්‍රීය කිරීමකින් තොරව) සෑම නිකුත් කරන්නෙකු විසින් ම අවලංගු කළ යුතුය. එවැනි ඕනෑම අවලංගු කිරීමක් පිළිබඳ ව පූර්ව දැනුම් දීමක් සිදු කල යුතු අතර, ඒසේ අවලංගු කිරීම පිළිබඳව විධිවිධාන නිකුත් කරන්නාගේ පොදු නියම හා කොන්දේසිවලට ඇතුළත් කළ යුතු ය.

5.1.4. වසරක් (1) ඉක්මවන කාලයක් සඳහා සක්‍රියව පවතින නමුත් භාවිතයට නොගත් සියලු ම ක්‍රෙඩිට් කාඩ්පත් සෑම නිකුත් කරන්නෙකු විසින්ම අවහිර කළ යුතු ය. එවැනි ඕනෑම අවහිර කිරීමක් පිළිබඳ ව පූර්ව දැනුම් දීමක් සිදු කල යුතු අතර, ඒසේ අවහිර කිරීම පිළිබඳ විධිවිධාන නිකුත් කරන්නාගේ පොදු නියම හා කොන්දේසිවලට ඇතුළත් කළ යුතු ය.

5.1.5. සෑම නිකුත් කරන්නෙකු ම ක්‍රෙඩිට් කාඩ්පතක් නිකුත් කිරීමට පෙර, ගනුදෙනුකරුවන් පිළිබඳ මූලික ඇගයීමක් සිදු කිරීමට විකුණුම් නියෝජිතයින් සඳහා නිර්ණායකයන් සකස් කළ යුතු ය.

**5.2. පොලී අනුපාතික තීරණය කිරීම සහ ක්‍රමවේදය**

5.2.1. සෑම නිකුත් කරන්නෙකු ම ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා අය කරන පොලී අනුපාතිකයේ විනිවිදභාවය සහ පැහැදිලි බව ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය.

5.2.2. සෑම නිකුත් කරන්නෙකු ම පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රමිතිගත පොලී අනුපාතික ගණනය කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු ය:

5.2.2.1.ගෙවීම් දිනය දක්වා පමණක් ගනුදෙනු පදනම මත පොලිය ගණනය කළ යුතු ය.

5.2.2.2.පසුගිය ණය චක්‍රවල සිදු කළ ගනුදෙනු මත නොව අදාළ මාසයේ ගෙවීමට ඇති හිඟ මුදල සඳහා පමණක් පොලිය අය කළ යුතු ය.

5.2.2.3.ගනුදෙනුකරුවන් සඳහා දින විසි එකක (21) සහන කාලයක් ලබා දිය යුතු ය. නියමිත දිනට හෝ ඊට පෙර සමස්ත ශේෂය සම්පූර්ණයෙන් ගෙවනු ලබන විට, මුදල් අත්තිකාරම් ඇතුළුව එවැනි ශේෂයක් සඳහා කිසිදු පොලියක් අය නොකළ යුතු ය. ඉහත සඳහන් කරුණුවල කෙසේ සඳහන් වුවද, ආයතනික ක්‍රෙඩිට් කාඩ්පත් සහ අනෙකුත් පොලී රහිත ක්‍රෙඩිට් කාඩ්පත් සම්බන්ධයෙන්, අදාළ සහන කාලය තීරණය කිරීම නිකුත් කරන්නන් සතු වන අතර එවැනි නියම සහ කොන්දේසි කාඩ්පත් හිමියාට පැහැදිලිව හෙළි කළ යුතු ය.

5.2.2.4.සියලුම ගෙවීම් සඳහා දින ගණන ගණනය කිරීමේ දී, ගිණුමට සටහන් කරන ලද දිනය නොව, ගනුදෙනු කළ දිනය සලකා බැලිය යුතුය. කාඩ්පත් නිකුත් කරන්නන් විසින් අදාළ ගෙවීම් කාල සීමාවන් ගනුදෙනුකරුවන් හට පැහැදිලිව හෙළිදරව් කළ යුතුය. එසේ හෙළිදරව් කළ කාල සීමාවෙන් පසු ව ගෙවීමක් ලැබුණහොත්, දින ගණන ගණනය කිරීමේ දී හා වෙනත් අදාළ කාලරාමු සඳහා එම ගෙවීම ඊළඟ දිනයේ සිදු කළ ගෙවීමක් ලෙස සැලකිය හැකි ය.

5.2.2.5.එකම ගනුදෙනුව සඳහා බිල්පත් කාල සීමා කිහිපයකදී පොලිය ගණනය කිරීමේ දී එකම දිනය දෙවරක් ගණනය නොවන බව කාඩ්පත් නිකුත් කරන්නන් විසින් තහවුරු කළ යුතු ය.

5.2.2.6.පොලී ගණනය කිරීම් දින 365ක වසරක් මත පදනම් විය යුතුය.

**5.3. ගෙවීම් අවශ්‍යතා සහ ගාස්තු**

5.3.1. සෑම නිකුත් කරන්නෙකුම මාසික ප්‍රකාශනයේ අවම ගෙවීම් අවශ්‍යතාව සහ ක්‍රෙඩිට් කාඩ්පතට අදාළ හිඟ ශේෂය සඳහා අය කරනු ලබන පොලී අනුපාතිකය පැහැදිලි ව හෙළිදරව් කර ඒ පිළිබඳව විනිවිදභාවය සහතික කළ යුතු ය.

5.3.2. සෑම නිකුත් කරන්නෙකු ම එක් එක් ක්‍රෙඩිට් කාඩ්පතට අදාළ සියලු ප්‍රතිලාභ සියලු ම ප්‍රචාරණ මෙවලම්වල සහ නිකුත් කරන්නාගේ වෙබ් අඩවිය තුළ පැහැදිලි ව හෙළිදරව් කළ යුතු ය.

5.3.3. ගනුදෙනුකරුගේ ප්‍රකාශිත ඉල්ලීමක් මත පමණක් ණය සීමාව වැඩි කිරීම බලාත්මක කිරීම සිදු කළ යුතු ය. ස්වයංක්‍රීය වැඩි කිරීම් තහනම් වේ.

## 6. ක්‍රියාත්මක කිරීමේ කාල රාමුව

| සන්ධිස්ථානය | අවශ්‍යතාව | කාල සීමාව |
|---|---|---|
| **අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය** | අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක කිරීමේ සැලසුම අනුමත කිරීම | 30.10.2026 |
| **පද්ධති සහ ක්‍රියාවලීන්හි පූර්ව සූදානම** | පද්ධති, පාලන සහ කාර්ය මණ්ඩල පුහුණුව සම්පූර්ණ කිරීම | 30.12.2026 |

## 7. අධීක්ෂණ සමාලෝචනය සහ බලාත්මක කිරීම

මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් අනුකූලතාව තහවුරු කිරීම සඳහා විතැන් සමාලෝචන, ස්ථානීය පරීක්ෂණ, තේමාත්මක සමාලෝචන, ආයතන සමග රැස්වීම් හෝ වෙනත් අධීක්ෂණ ඇගයීම් කටයුතු සිදු කරනු ලැබිය හැකිය. මෙම මාර්ගෝපදේශයට අනුකූල වීමට අපොහොසත්වීම අදාළ රෙගුලාසි යටතේ පවතින නියාමන ක්‍රියාමාර්ගවලට මුහුණ දීමට හේතු විය හැකිය.

## 8. බලපැවැත්වෙන දිනය සහ සමාලෝචනය

මෙම මාර්ගෝපදේශය 2027.01.01 දින සිට බලාත්මක විය යුතු ය. වෙළඳපොළ වර්ධනයන්, අධීක්ෂණයන්හිදී අනාවරණය කරගත් කරුණු, නීතිමය වෙනස්කම්, ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ මූල්‍ය ස්ථායිතාව පිළිබඳ කරුණු සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුවට මෙම මාර්ගෝපදේශය කලින් කලට සමාලෝචනය කිරීමට, සංශෝධනය කිරීමට, ප්‍රතිස්ථාපනය කිරීමට, අත්හිටුවීමට හෝ ඉවත් කිරීමට හැකි ය.

**ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ**
*පාලක මණ්ඩලයේ සභාපති සහ*
*ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති*